# සාමාන්‍ය සමයේ විසිතුන්වන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන් වෙත ලියන ලද හසුනෙන් කොටසකි.

කොලොස්සි 1: 24 – 2 : 3

**"යුග හා පරම්පරා ගණනාවක් තිස්සේ රහසක්ව සැඟවී තිබූ පණිවුඩය අනාවරණය කරන පිණිස මම සභාවේ සේවකයකු වෙමි."**

ඔබ උදෙසා මා විඳින දුක් ගැන දැන් මම ප්‍රීති වෙමි. මගේ ඒ ශරීරය දුක් විඳීම හේතුකොටගෙන, ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය වන සභාව උදෙසා උන් වහන්සේගේ දුක් විඳීමේ ඌනතා සම්පූර්ණ කිරීමට මම සහාය වෙමි. මේ සභාවේ සේවකයකු වශයෙන් දෙවියන් වහන්සේ මා පත් කර, ඔබේ යහපත උදෙසා මට වගකීමක් භාර දුන් සේක. ඒ වගකීම නම් දෙවියන් වහන්සේගේ පණිවුඩය සම්පූර්ණයෙන් ප්‍රකාශ කිරීම ය. ඒ පණිවුඩය, යුග හා පරම්පරා ගණනාවක් තිස්සේ රහසක්ව සැඟවී තිබී, දැන් උන් වහන්සේගේ සැදැහැවතුන් හට එය අනාවරණය කර ඇත. ඔවුන් හට එය අනාවරණය කරන ලද්දේ ඒ රහසේ තේජාන්විත සම්පත කුමක් දැයි සකල ජාතීන්ට දන්වනු පිණිස ය. ඒ රහස නම් ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ වැඩ විසීම ය. උන්වහන්සේගේ ඔබේ තේජාන්විත බලාපොරොත්තුව වන සේක. අප ප්‍රකාශ කරන්නේ ඒ ක්‍රිස්තුස් වහන්සේ ය. සියලු දෙනාම පරිණත කිතුණුවන් වන පිණිස සියලු දෙනාට දැනමුතුකම් දෙමින් සියලු ආකාර ප්‍රඥාවෙන් අනුශාසනා කරමු.

මේ සඳහා, මා තුළ බලවත් සේ ක්‍රියා කරන ක්‍රිස්තුස් වහන්සේගේ බල මහිමයේ ප්‍රකාරයට දිරි දරමින් වීර්ය කරමි.

ඔබ උදෙසාත්, ලවෝදිසයේ වැසියන් උදෙසාත්, පෞද්ගලික වශයෙන් මා නුදුටු සියල්ලන් උදෙසාත් මා කොතරම් අධික ලෙස වෙහෙස මහන්සි දරනවා දැයි ඔබට දන්වන්නට කැමැත්තෙමි. මා එසේ කරන්නේ ඔවුන්ගේ සිත් ධෛර්යවත් වන පිණිසත්, ඔවුන් ප්‍රේමයෙන් එකට බැඳී සිටින පිණිසත්, අවබෝධයෙන් ඇතිවන සම්පූර්ණ සහතිකකමේ සම්පත උරුම කරගෙන, දෙවියන් වහන්සේගේ රහස තේරුම්ගන්න පිණිසත් ය. ඒ රහස ක්‍රිස්තුස් වහන්සේ ම ය. උන් වහන්සේ තුළ ප්‍රඥාවේත් දැනගැන්මේත් සකල ධන සම්භාරය නිදන් වී ඇත.

දේව වචනය මෙසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 62: 5-6, 8

පිළිතුර: මාගේ රැකවරණයත් මහිමයත් දෙවිඳුන් තුළ ය.

ගීය:

මාගේ සිතට සහනය ඇත්තේ දෙවිඳුන් තුළ පමණෙකි.
මට ගැලවීම ලැබෙන්නේ එතුමාණන්ගෙන් පමණකි.

මාගේ පර්වතයත්, ගැලවීමත්, බලකොටුවත් එතුමාණෝ පමණකි.
එබැවින් මම නොසැලී සිටින්නෙමි.

ජනයෙනි, දෙවිඳාණන් තුළ විශ්වාසය තබන්න. එතුමාණෝ අප සරණය වන සේක. එතුමාණන් අබිමුව ඔබේ දුක් ගැනවිලි පවසන්න.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති.
මම ද ඔවුන් අඳුනමි. ඔව්හු ද මා පසුපස්සේ එති.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"සමිඳුනි, ඔබගේ වචන මාගේ දෙපයට පහනක්ය.
මාගේ මාවතට එළියක් ය."
ආලේලූයා!

## සුවිශේෂය

ලූක්තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 6: 6-11

**"ඔව්හු උන්වහන්සේ සබත් දිනයේ දී සුව කරනු ඇද්දැයි බලමින් සිටියහ."**

තවත් සබත් දිනෙක ජේසුස් වහන්සේ ධර්ම ශාලාවට ඇතුල්ව ඉගැන්වූ සේක. දකුණු අත පණ නැති මිනිසෙක් එහි විය. එවිට විනයධරයෝ ද

පරිසිවරු ද උන්වහන්සේට විරුද්ධව චෝදනාවක් එල්ල කරන අටියෙන් උන්වහන්සේ සබත් දිනයේ දී සුව කරනු ඇද්දැයි බලමින් සිටියහ. එහෙත් උන්වහන්සේ ඔවුන්ගේ සිතුවිලි දැන, "නැගිට මෙහි මැද සිටින්නැ"යි අත පණ නැති මිනිසාට වදාළ සේක. ඔහු එහි නැගිට සිටියේය. එකල ජේසුස් වහන්සේ "සබත් දිනයේදී අප කළ යුත්තේ යහපත ද නොහොත් අයහපත ද, ප්‍රාණයක් ගැලවීම ද නොහොත් නැසීම ද යන ප්‍රශ්නය මම ඔබෙන් අසමි"යි වදාළ සේක. උන්වහන්සේ ඔවුන් සියල්ලන් දෙස වටේට බලා "ඔබේ අත දිග හරින්නැ"යි ඔහුට වදාළ සේක. ඔහු එසේ කළේය. අත සුව විය. එවිට ඔව්හු කෝපයෙන් උමතු වී, "ජේසුස් වහන්සේට කුමක් කරමු දැ"යි තම තමන් අතර කතා කරගන්නට වූහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.